www.agaram.lk



# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

10 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය | ඒකකය : ප්‍රජාතන්ත්‍රවාදී පාලනය

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1) අතීතයේ පටන් ලෝකයේ විවිධ රාජ්‍යයන් පාලනය කිරීම සඳහා භාවිතා කළ පාලන ක්‍රම තුනක් නම් කරන්න.
2) ප්‍රජාතන්ත්‍රවාදයේ ආරම්භක රට නම් කරන්න.
3) සෘජු ප්‍රජාතන්ත්‍රවාදි පාලන ක්‍රමය යනු කුමක් ද?
4) ඇතැන්ස් පෞර රාජ්‍යයේ ප්‍රධාන පාලන ආයතනය නම් කරන්න.
5) ක්‍රි.පූ. 6 වන සියවසේ සමූහාණ්ඩු පාලනයක් පැවති බවට තොරතුරු හමුවන ජනපදය කුමක් ද?
6) සප්ත අපරිහානිය ධර්ම හතරක් නම් කරන්න.
7) ක්‍රි.ව. 5 වන සියවසේ සිට 15 වන සියවස දක්වා යුරෝපයේ පැවති සමාජ ක්‍රමය කුමක් ද?
8) ඉංග්‍රීසි විප්ලවය සිදුවූ වර්ෂය නම් කරන්න.
9) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයේ දැකිය හැකි ප්‍රධාන ස්වරූප දෙක නම් කරන්න.
10) සෘජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ගැටලු 3ක් නම් කරන්න.
11) ප්‍රජාතන්ත්‍රවාදය යනු සියලු දෙනාටම අයිතිවාසිකම් හිමිවන පාලන ක්‍රමයක් ලෙස ප්‍රකාශ කරනු ලැබුවේ කවුරුන් විසින් ද?
12) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මහජන නියෝජිතයින් තෝරා පත්කර ගනු ලබන්නේ කෙසේ ද?
13) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක අංග ලක්ෂණ 4ක් ලියන්න.
14) සර්වජන ඡන්ද බලය යනු කුමක් ද?
15) බහුපක්ෂ ක්‍රමය ක්‍රියාත්මක වන රටවල් 3ක් නම් කරන්න.
16) ද්විපක්ෂ ක්‍රමය ක්‍රියාත්මක වන රටවල් 3ක් නම් කරන්න.
17) ඒකපක්ෂ ක්‍රමය ක්‍රියාත්මක වන රටවල් 3ක් නම් කරන්න.
18) තරගකාරි පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණ 3ක් ලියන්න.
19) ව්‍යවස්ථාදායකයට හා ප්‍රාදේශීය පාලන ආයතන වලට නියෝජිතයින් තෝරා පත්කර ගනු ලැබීම සඳහා වර්තමානයේ බහුලව අනුගමනය කරනු ලබන ක්‍රම මොනවා ද?
20) ලංකාවේ ව්‍යවස්ථාව අනුව ඡන්ද කොට්ඨාශ බෙදා වෙන්කරනු ලබන්නේ කවර ආයතනය මගින් ද?
21) ඡන්ද කොට්ඨාශ බෙදා වෙන් කිරීමේ දී යොදා ගනු ලබන නිර්ණායක මොනවා ද?
22) ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක සංඛ්‍යාව කොපමණ ද?
23) ලංකාවේ මැතිවරණ දිස්ත්‍රික්ක සංඛ්‍යාව කොපමණ ද?
24) නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණ 3ක් ලියන්න.
25) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටක ඡන්ද දායකයකු සතු අයිතිවාසිකම් 3ක් දක්වන්න.
26) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය සාර්ථක කර ගැනීමට විරුද්ධ පක්ෂයෙන් ඉටුවිය යුතු කාර්යයන් 3ක් දක්වන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk



agaram.lk

27) සමානාත්මතාවය යනු කුමක් ද?

28) අයිතිවාසිකම් යනු මොනවා ද?

29) අයිතිවාසිකම් පිළිබඳ එ.ජා. මහා මණ්ඩලය මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සම්මත කරනු ලැබූ වර්ෂය, මාසය හා දිනය දක්වන්න.

30) රටක මූලික නීතිය වන්නේ කුමක් ද?

31) ආණ්ඩුවේ ප්‍රධාන කොටස් තුන මොනවා ද?

32) ප්‍රජාතන්ත්‍රවාදී රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීම නිසා ලැබෙන ප්‍රයෝජන 3ක් ලියන්න.

33) රාජ්‍යයක් තුළ දක්නට ලැබෙන මූලික ලක්ෂණ හතරක් නම් කරන්න.

34) ජාතික රාජ්‍ය බිහිවීමට බලපෑ හේතු 3ක් ලියන්න.

35) ජාතික රාජ්‍යයක ලක්ෂණ 3ක් ලියන්න.

36) රාජ්‍යයකට පැවරෙන කාර්යයන් සඳහා උදාහරණ 3ක් දක්වන්න.

37) බලය බෙදා ඇති ආකාරය අනුව රාජ්‍යයන් වර්ගකර ඇති ප්‍රධාන කොටස් දෙක මොනවා ද?

38) ව්‍යවස්ථාදායකය සතු කාර්යයන් මොනවා ද?

39) පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක විධායකය ලෙස සැලකෙන්නේ කවු ද?

40) ජනාධිපති ආණ්ඩු ක්‍රමයක විධායකයේ ප්‍රධානියා ලෙස සැලකෙන්නේ කවු ද?

41) අධිකරණය මගින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන් මොනවා ද?

42) නූතන රාජ්‍යයන්හි මූලික වශයෙන් දක්නට ලැබෙන ආණ්ඩුක්‍රම දෙක නම් කරන්න.

43) නීතිමය යුතුකම් 3ක් දක්වන්න.

44) සදාචාරාත්මක යුතුකම් 3ක් දක්වන්න.

45) රාජ්‍යයක් සතු වගකීම් 3ක් නම් කරන්න.

46) ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියකු සතුවිය යුතු ගුණාංග මොනවා ද?

47) ජනාධිපති ආණ්ඩු ක්‍රමයක විශේෂ ලක්ෂණ මොනවා ද?

48) මානව සංවර්ධනයට බලපානු ලබන සාධක මොනවා ද?

49) ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් තුළ ක්‍රියාත්මක වන සාමාකාමී ජන සමාජයක් ගොඩනැගීමට හේතුවන ලක්ෂණ මොනවා ද?

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!



agaram.lk